ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව |
| දිනය | 11.03.2013 |

**2013 – 2015 කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් සංසරණ කාසි ටංකනය කර සැපයීම සඳහා නව කොන්ත්‍රාත්තු**

2013 – 2015 කාලපරිච්ඡේදය සඳහා රුපියල, රුපියල් 2, රුපියල් 5 සහ රුපියල් 10 වටිනාකම් වලින් යුත් සංසරණ කාසි ටංකනය කර සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ෆින්ලන්තයේ ෆින්ලන්ඩ් මින්ට් ආයතනය, නෙදර්ලන්තයේ රෝයල් ඩච් මින්ට් ආයතනය සහ ස්ලෝවැකියා ජනරජයේ මින්කොව්නා ක්‍රෙම්නිකා යන ආයතන වෙත ඇනවුම් බාර දෙන ලදි.

දැනට සංසරණයේ පවතින කාසි වල ස්වරූපයෙන්ම අලුතින් ටංකනය කරනු ලබන මෙම කාසි 2013 – 2015 කාල පරිච්ඡේදය තුලදී ජනතා ඉල්ලුම සපුරනු වස් ක්‍රම ක්‍රමයෙන් සංසරණයට එකතු කරනු ඇත.

සංසරණයට එක් නොවී තැන් තැන්වල එකතු වී ඇති විශාල කාසි තොග එකතු කර නැවත සංසරණයට එකතු කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙලක් ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දියත් කරනු ඇත.

අධිකාරී
ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත
කොළඹ 01.

